museum of modern
and contemporary art
sri lanka

## _2023ට සූදානමින්!

2022 තුළ අපගේ ක්‍රියාකාරකම්, පුහුණුවීම්, හා පර්යේෂණ සඳහා අරමුදල් සපයා අනුග්‍රහය දැක්වූ සියලු දෙනාට අපි ස්තුතිය පළකරමු. ඔබේ සහයෝගයෙන්, ශ්‍රී ලංකාවේ නූතන හා සමකාලීන කලාව සඳහා නව ප්‍රේක්ෂකත්ව ගොඩනැගීමට MMCA ශ්‍රී ලංකා කටයුතුකරයි. අප ජීවත්වන කාල වකවානුවේ මනා අවබෝධය හා ආවර්ජනය ඇති කිරීමට සංස්කෘතිය වැදගත් භූමිකාවක් ඉටු කරයි. කලා ඉතිහාස අපට මෙම භූමිකාව මතක් කරදෙන අතර, එවැනි ඉතිහාස ගවේෂණයකිරීමට හා ඒ පිළිබඳව දැනුවත්කිරීම අරමුණු කරගත් ප්‍රදර්ශන සංවිධානයකිරීමට ඔබේ සහයෝගය අපට උපකාර වේ.

ඔබ 'මුණගැසීම්හි' තෙවන වටමාරුව නරඹා නොමැතිනම් (2023 මාර්තු 19 අවසන්), නොපමාව ප්‍රදර්ශනය නැරඹීමට පැමිණෙන්න. ගැලරි වටා ඔබ කැටුව ගොස් ඔබේ ප්‍රශ්නවලට සිංහලෙන්, දෙමළෙන්, හා ඉංග්‍රීසියෙන් පිළිතුරු දීමට අපේ බාහිර අධ්‍යාපනඥයන් සූදානම්. ඒ. මාර්ක් (1933–2000), ජෝර්ජ් කීට් (1901–1993), නෙලුන් හරස්ගම (b. 1959), හා ජනනි කුරේ (b. 1974) යන අයගේ කලාකෘති මෙහි අලුත්න් ප්‍රදර්ශනය වේ.

2023 සඳහාවන අපගේ ආකර්ෂණීය නව වැඩසටහනට 'ආගන්තුකයෝ' නමින් මැයි මාසයේදී විවෘතවන අපගේ මීළඟ ප්‍රදර්ශනය හා, ඔක්තෝබර් මාසයට සැලසුම්කර ඇති අපගේ දෙවන 'කෞතුකාගාර තීව්‍රය' ඇතුළත් ය. මේ පිළිබඳ වැඩි විස්තර සමඟ, තවත් උද්වේගකර වැඩසටහන් හා ප්‍රදර්ශන රාශියක් ඔබ සමඟ ඉක්මනින් බෙදා ගැනීමට අපි බලාපොරොත්තු වෙමු!

## _2022 දෙස ආපසු හැරී බලමු

2022 වසර ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික කැළඹිලි ඇතිවූ වසරකි. එය, නිදහස ලැබූ පසු ඇතිවූ දරුණුතම ආර්ථික අර්බුදයට එරෙහිව මහජනතාව එකතුවී විරෝධය පළකළ අවස්ථාවක් ද විය. විරෝධතා හා ඉන්ධන ගැටළු හේතුවෙන් වසා දැමීම් සිදුවුව ද, අපි 16,000කට අධික නරඹන්නන් පිරිසක් පිළිගෙන ප්‍රදර්ශන හා විවිධ අංග සපිරි වැඩසටහනක් නොමිලේ ලබාදුන්නෙමු.

කොළඹ 3, ක්‍රෙස්කැට් බූලෙවාඩ්හි බිම් මහලේ නව පරිශ්‍රයක් විවෘතකරමින්, MMCA ශ්‍රී ලංකා 2022 පෙබරවාරි 10වන දින 'මුණගැසීම්' නමින් සිය දෙවන ප්‍රදර්ශනය දියත්කරන ලදී. ප්‍රදර්ශනය අනුක්‍රමික වටමාරු තුනක් විවෘතකර ඇත. 2022 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා අමුත්තන් 1,869 නොමිලේ පැවැත්වූ පොදු වැඩසටහන් 101කට සම්බන්ධවූ අතර, ඒවාට ගැලරි කතා 15, වැඩමුළු 19, අභිරක්ෂක

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

චාරිකා 31, හා ප්‍රහේලිකා දින, ප්‍රසංග, හා චිත්‍රපට තිරගතකිරීම් සමන්විත විශේෂ වැඩසටහන් 30 ඇතුළත් විය. MMCA ශ්‍රී ලංකා ව්‍යාප්ති වැඩසටහන්වල කොටසක් ලෙස පවත්වන ලද අභිරක්ෂක චාරිකා 28කට තවත් අමුත්තන් 656 සම්බන්ධවූයේ ය.

MMCA ශ්‍රී ලංකාහි වර්ධනයත් සමඟ එහි පුහුණු උත්සාහයන් ද වැඩෙයි. 2022 දී, අපි දිවයින පුරා සංවිධාන 18 සම්බන්ධකර ගනිමින් අපගේ පළමු කෞතුකාගාර තීව්‍ර වැඩසටහන පැවැත්වූවා. මෙය නෙදර්ලන්තයේ රයින්වෝඩ් ඇකඩමිය සහ සංස්කෘතික උරුම නියෝජිතායනය සමඟ සහයෝගයෙන් පැවැත්විණි. පසුගිය වසර තුළ, අපි සීමාවාසික පුහුණුවීම් 14කට ද සත්කාරකත්වය සැපයූ අතර, අපගේ පොදු සහභාගිත්වයේ ප්‍රයත්නයන්වල කොටසක් ලෙස බාහිර අධ්‍යාපනඥයන් 40 දෙනකු බඳවාගැනිණි. කෞතුකාගාරයට පැමිණීමට පාසල් මුහුණ දෙන දුෂ්කරතාවන්ට ප්‍රතිචාර දක්වමින්, අපි වයස අවුරුදු 6–10 අතර පාසල් ළමුන් සඳහා උත්තේජනයෙන් යුතු, විනෝදමත්, සහ සහයෝගී ඉගෙනුම් අත්දැකීම් ලබා දෙන MMCA Afterschool දියත් කළෙමු.

## _පැමිණෙන්න

බිම් මහල
ක්‍රෙස්කැට් බූලෙවාඩ්
89 ගාලු පාර
කොළඹ 3

**ඇතුළුවීම නොමිලේ (සියලු වැඩසටහන් ඇතුලත්ව)**

**පෑ**
**දිනපතා පෙ.ව. 10–ප.ව. 6**

**පෝය දිනවල සහ ප්‍රසිද්ධ නිවාඩු දිනවල වසා ඇත.**

වැඩි විස්තර සඳහා, www.mmca-srilanka.org වෙත පිවිසෙන්න නැතිනම් facebook.com/mmcasrilanka පිටුව හෝ ඉන්ස්ටාග්‍රෑමයට පිවිසී instagram.com/mmcasrilanka/ නව තොරතුරු දැනගන්න.